**පසු සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන - 2013**

---

පසු සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහනේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2005 දෙසැම්බර් 01 දින එළඹි අංක 664 - එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 (අ) වගන්තිය සහ 2008 අප්‍රේල් 18 දින එළඹි අංක 693 - එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 3.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධානය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

---

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වන්නේ, විශේෂයෙන් නිවාස සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය සමාජ හා ආර්ථික යටිතල පහසුකම් සැපයීම, සුනාමිය බලපෑ ප්‍රජාවන් ශක්තිමත් කිරීම සහ වෙරළ සම්පත් සැලකිය යුතු ලෙස කළමනාකරණය කිරීම සහ සමාජ ආර්ථික කටයුතුවලදී කාන්තා සහභාගීත්වය වැඩි කිරීමයි. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 36.14 ක් වන අතර එයින් රු.මිලියන 3386.8 කට සමාන එජඩො මිලියන 31.35 ක් හෙවත් සියයට 86.7 ක් මූල්‍යයනය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, එකඟ වී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2006 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2013 දෙසැම්බර් 31 දින නිම කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන

ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී.ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්,වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් වැඩසටහන් වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම්, හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්,ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක ශේෂය සහ අවසන් ශේෂය එම ගිණුමෙන් ආපසු ගැනීම හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ඉකුත් වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**----------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2013 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂයන්2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහන් වියදම රු. 440,127,441 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 3,890,562,239 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම, ඉකුත් වර්ෂයේ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 208,210,383 | 764,342,234 | 2,668,383,781 |
| මෝටර් වාහන, උපකරණ සහ යාත්‍රා | (6,175,608) | 2,975,066 | 191,046,026 |
| තාක්ෂණික සහාය සහ අධ්‍යයන | 14,992,123 | 7,145,890 | 83,267,559 |
| පුහුණු වැඩමුළු | 23,030,533 | 7,221,205 | 98,908,804 |
| සේවා සපයන්නා සම කොන්ත්‍රාත්තු | 30,566,621 | 28,482,642 | 93,883,902 |
| අරමුදල් ( ආපසු නොගෙවිය යුතු ප්‍රදාන) | 39,415,500 | 27,241,939 | 72,252,939 |
| වර්ධක ණය | 65,770,598 | 111,122,074 | 190,841,280 |
| වැටුප් හා දීමනා | 41,721,958 | 42,821,125 | 246,018,595 |
| මෙහෙයුම් හා නඩත්තුව | 22,595,333 | 23,342,610 | 129,060,269 |
| කැනඩා ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතන ප්‍රදානවලින් දරන ලද වියදම් | නැත | නැත | 116,899,084 |
| එකතුව | 440,127,441 | 1,014,694,785 | 3,890,562,239 |

4.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් සහ එම ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---:|---:|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 332,003 | 42,217,773 |
| එකතු කළා: | | |
| ඌන පූරණයන් | 1,606,028 | 206,398,407 |
| විදේශ විනිමය වාසිය | - | 1,295,293 |
| අඩු කළා: | 1,938,031 | 249,911,473 |
| ආපසු ගැනීම් | 1,907,465 | 245,914,907 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 30,566 | 3,996,566 |

5. විගණන නිරීක්ෂණ

5.1 ගිණුම්කරණ අඩුපාඩු

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලට ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු එජඩො 175,846 ක ශේෂය ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි.

6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

6.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යයනය, අයවැය ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රතිපාදනය කිරීමට එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| කෘසජාඅ | 31.35 | 3,386.81 | 401.56 | 427.56 | 31.66 | 3,714.89 |
| ශ්‍රීලංර | 4.37 | 471.96 | 12.38 | 12.38 | 1.43 | 154.89 |
| ප්‍රතිලාභීන් | 0.42 | 45.67 | - | - | 0.19 | 20.78 |
| එකතුව | 36.14 | 3,904.45 | 413.94 | 440.13 | 33.28 | 3,890.56 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමහර කාර්යයන් සඳහා දරන ලද තථ්‍ය පිරිවැය ඒ සඳහා කරන ලද වෙන් කිරීම්වලට වඩා සැලකිය යුතු ලෙස ඉක්මවා තිබුණු අතර එම අතිරික්ත, ව්‍යාපෘතියේ වෙනත් කාර්යයන්වලට හිලව් කර තිබුණි. කෙසේ වෙතත් එවැනි යළි වෙන්කිරීම් සඳහා වූ අරමුදල් සපයන නියෝජිතායතනයේ අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| සංරචකය | වෙන් කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | වෙන් කිරීමට වැඩි අතිරික්තය | අතිරික්තයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | එජඩො | එජඩො | එජඩො | |
| සිවිල් වැඩ | 10,170,600 | 12,807,603 | 3,637,003 | 125.9 |
| සේවා සපයන්නන් සමඟ කොන්ත්‍රාත්තු | 154,100 | 410,838 | 256,738 | 266.6 |
| වැටුප් හා දීමනා | 693,450 | 838,437 | 144,987 | 120.9 |

(ආ) පහත සඳහන් සංරචකවල අරමුදල් උපයෝජන ප්‍රතිශතය පහළ මට්ට පැවති බව නිරීක්ෂණය විය.

| සංරචකය | අරමුදල් වෙන් කිරීම | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | ඉතිරිය | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මෝටර් වාහන, උපකරණ සහ යාත්‍රා | 508,530 | 34,918 | 473,612 | 6.9 |
| තාක්ෂණික සහාය සහ අධ්‍යයනයන් | 308,200 | 51,476 | 256,724 | 16.0 |

(ඇ) කාන්තාවන් සඳහා ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙනුවෙන් ආපසු නොගෙවිය යුතු ණය සඳහා අංක 664 එල්කේ සහ 693 එල්කේ යටතේ කරන ලද වෙන් කිරීම්වලින් ව්‍යාපෘති කාලසීමාව අවසන් වන විට උපයෝජනය කර තිබුණේ පිළිවෙලින් සියයට 69 ක් සහ සියයට 4.6 ක් පමණි.

(ඈ) රු. 2,510,819 කට සමාන එජඩො 19,240 ක පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා 2013 අගෝස්තු 13 දින කරන ලද ඉල්ලීම ණය දෙන නියෝජිත ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

6.2 භෞතික කාර්යසාධනය
-------------------------

(අ) වැඩසටහනේ වෙරළ සම්පත් සැලකිය යුතු ලෙස කළමනාකරණය කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) වැඩසටහනේ සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘති සමාප්ත වාර්තාවට අනුව, වැඩසටහනේ සමාජ ආර්ථික යටිතල පහසුකම් සංරචකය යටතේ වූ කාර්යයන් 7 ක ඉලක්ක සපුරා ගැනීම, වැඩසටහන් කාල පරිච්ඡේදය අවසාන වන විට සියයට 33 සිට සියයට 84 දක්වා පරාසයක පැවතුණි.

විස්තර පහත දැක්වේ.

| | **කාර්යය** | **ඉලක්කය** | **තථ්‍ය** | **ඉටුකර ගැනීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| i. | නව නිවාස ඉදිකිරීම (ඒකක) | 1,000 | 793 | 79 |
| ii. | නිවාස පුනරුත්ථාපනය (ඒකක) | 1,130 | 633 | 56 |
| iii. | ළිං ඉදිකිරීම (ඒකක) | 1,350 | 590 | 44 |
| iv. | මුළුතැන්ගෙය ඉදිකිරීම (ඒකක) | 1,200 | 858 | 72 |
| v. | වැසි ජලය රැස්කිරීම පද්ධති ඉදිකිරීම් හෝ පුනරුත්ථාපනය(ඒකක) | 1,200 | 807 | 67 |
| vi. | පානීය ජල පද්ධති ඉදිකිරීම හෝ පුනරුත්ථාපනය(ඒකක) | 150 | 50 | 33 |
| vii. | මාර්ග (නිරවුල් කිරීම්) ඉදිකිරීම හෝ පුනරුත්ථාපනය (කිලෝමීටර්) | 100 | 84 | 84 |

6.3 වත්කම් කළමනාකරණය
----------------------------

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ලංකා ධීවර සංස්ථාව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැනි ආයතනවලට වත්කම් භාරදුන් බවට වූ සනාථ කිරීම් විගණනයට ලබාදී නොතිබුණි. තවද, එම ආයතනවල අදාළ අංශ විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන නොමැති බව නිරීක්ෂණය විය. එබැවින් , එවැනි වත්කම් බාහිර පාර්ශව විසින් අයථා පරිහරණය නොකෙරේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

6.4 මතභේදයට තුඩුදෙන කරුණු
------------------------------

පුහුණු සැසි හා සම්මන්ත්‍රණ පිළිබඳ සංරචක යටතේ කරන ලද විදේශීය හා දේශීය පුහුණු කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය ගිවිසුමේ විදේශ පුහුණු කටයුතු වෙනුවෙන් වෙන් කිරීම් කර නොතිබුණි. තවද, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2013 අගෝස්තු 25 දිනැති අංක එස්එෆ්/6/1/2/05 දරන ලිපියෙන් උපදෙස් දී තිබුණේ අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා පමණක් උපයෝජනය කළ යුතු බවයි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය රු. 19,867,014 ක මුදලක් විදේශ පුහුණු කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි.

(ආ) 2013 සැප්තැම්බර් 03 සිට 21 දක්වා නේපාලයේ පැවැත්වූ “ කාන්තා අභිවෘද්ධි - නව ව්‍යාපාර සහ තිරසාර ජාතික සම්පත් කළමනාකරණය ” පිළිබඳ වැඩමුළුවකට නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී තිබුණි. අදාළ නිලධාරීන්ට වැඩමුළුව අවසන් වී දින තුනක් විදේශ ගතව සිටීමට ඉඩදී ඒ සඳහා යැපීම් හා සංයුක්ත දීමනා ලෙස රු.228,228 ක් ගෙවා තිබුණි.

(ඇ) ජනාධිපති ලේකම්ගේ 2012 ජුනි 11 දිනැති අංක සීඑස්අයි1/16 දරන ලිපියෙන් 05 ඡේදය අනුව නිලධාරීන්, ඔවුන්ට පුද්ගලික ආරාධනා මත ලැබෙන විදේශ ශිෂ්‍යත්ව සහ වෙනත් වැඩසටහන්වලට සහභාගී නොවිය යුතුය. කෙසේ වෙතත්, 2013 ඔක්තෝබර් 9 සිට 11 දින දක්වා තායිලන්තයේ පැවති මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහනකට, ගණකාධිකාරීවරුන් 6 දෙනෙකු ඔවුන්ට පුද්ගලිකව විද්‍යුත් තැපැල මඟින් ලද ආරාධනාවක් මත සහභාගී වී තිබුණි. මේ සඳහා දැරූ වියදම රු.1,547,267 ක් විය.

(ඈ) ව්‍යාපෘතියෙන් සපයන ලද අරමුදල් උපයෝජනය කරමින් විදේශ පුහුණු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී නිලධාරීන් ආපසු දිවයිනට පැමිණ සති දෙකක් ඇතුළත, තම පුහුණුවෙන් ශ්‍රී ලංකා රජයට ලැබුණු ප්‍රතිලාභ පැහැදිලි කරමින් ඉදිරිපත් කළ යුතු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දින වැඩසටහන නිම කිරීමට නියමිතව තිබුණද, නිලධාරීන් රාශියක් විදේශ පුහුණුව සඳහා සහ දැනුම බෙදා ගැනීම් ආදී සම්මන්ත්‍රණවලට සහභාගී වීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී විදේශගතව තිබුණු අතර ඒ සඳහා වැඩසටහන රු. 19,867,014 ක පිරිවැයක් දරා තිබුණි.

7. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) විදේශ ගමන් හා වියදම්